# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

## අති විශෙෂ

අංක 2323/45 – 2023 මාර්තු මස 17 වැනි සිකුරාදා – 2023.03.17

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)


# III වැනි කොටස – ඉඩම්

## ඉඩම් රජයට ගැනීම පිළිබඳ දැන්වීම්

**ඉඩම් අත්කර ගැනීමේ පනත (460 වැනි පරිච්ඡේදය)**

5 වැනි වගන්තිය යටතේ ප්‍රකාශය

මෙහි පහත විස්තර කරනු ලබන ඉඩම්, පොදුජන කටයුත්තක් සඳහා අවශ්‍ය වන බවත්, ඒවා ඉඩම් අත්කර ගැනීමේ පනතේ විධිවිධාන යටතේ අත්කර ගනු ලබන බවත්, ඉඩම් අත්කර ගැනීමේ පනතේ 5 වැනි වගන්තියේ (1) උප වගන්තිය යටතේ, සංචාරක හා ඉඩම් අමාත්‍ය නාලක ජූඩ් හරින් ප්‍රනාන්දු වන මම මෙයින් ප්‍රකාශ කරමි.

දකුණු පළාතේ, හම්බන්තොට දිස්ත්‍රික්කයේ, වලස්මුල්ල ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ, වලස්මුල්ල නැගෙනහිර (අංක 454) ග්‍රාම නිලධාරි කොට්ඨාසයේ, උතුරු ගිරුවා පත්තුව සුළු කොට්ඨාසයේ වලස්මුල්ල ගමේ පිහිටි සර්වේයර් ජනරාල් විසින් සකස් කරන ලද අංක H/WLS/2021/205 සහ 2021.08.05 දිනැති ප්‍රගමන අනුරේඛනයේ පහත සඳහන් ඉඩම් කැබැලි වලට මායිම්:

01. **කැබලි අක්ෂර 'ඒ' – මිරිසියන්වත්ත – ප්‍රමාණය: හෙක්. 0.0111**

උතුරට: මාර්ගය (මා.සං.අ.) සහ කැබලි අක්ෂර බී; නැගෙනහිරට: කැබලි අක්ෂර බී සහ සිමෙන්ති කාණුව; දකුණට: සිමෙන්ති කාණුව සහ මාර්ගය (මා.සං.අ.); බටහිරට: මාර්ගය (මා.සං.අ.).

02. **කැබලි අක්ෂර 'බී' – මිරිසියන්වත්ත – ප්‍රමාණය: හෙක්. 0.0054**

උතුරට: මාර්ගය (මා.සං.අ.); නැගෙනහිරට: මාර්ගය (මා.සං.අ.) සහ සිමෙන්ති කාණුව; දකුණට: සිමෙන්ති කාණුව සහ කැබලි අක්ෂර ඒ; බටහිරට: කැබලි අක්ෂර ඒ සහ මාර්ගය (මා.සං.අ.).

හරින් ප්‍රනාන්දු,
සංචාරක හා ඉඩම් අමාත්‍ය.

මගේ අංකය: 4-3/5/2020/HW/151.

2022 අගෝස්තු මස 17 වැනි දින,
සංචාරක හා ඉඩම් අමාත්‍යාංශය,
"මිහිකත මැදුර",
රජමල්වත්ත පාර,
බත්තරමුල්ල.

EOG 03 - 0213


1A – G039110– 14 (2023/03) ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී

*මෙම අති විශෙෂ ගැසට් පත්‍රය* www.documents.gov.lk *වෙබ් අඩවියෙන් බාගත කළ හැක.*